**බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යාංශය**

**ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව**

කාරුණික නිවේදනයයි

සියලුම මුද්‍රණ ශිල්පීන් සහ ලේඛකයින් වෙත

මුද්‍රණ ශිල්පීනි, ඔබේ මුද්‍රණාලය නීත්‍යානුකූල මුද්‍රණාලයක් ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය බව ඔබ දන්නේද? ග්‍රන්ථ කර්තෘවරුනි, ඔබේ නිර්මාණ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ නීතිමය තැන්පතුවේ ලියාපදිංචි වනවාදැයි සැලකිලිමත් වනවාද?.

මුද්‍රණ ශිල්පීනි, ඔබ විසින් මුද්‍රණාලයක් පවත්වාගෙන යන්නේ නම් මුද්‍රණාල පිළිබඳ ආඥා පනතේ (178 වන අධිකාරය) 2 (1) වගන්තිය ප්‍රකාරව ගරු මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ ප්‍රකාශයක් සිදුකර එම මුද්‍රණාලය ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ පොත් සහ ප්‍රවෘත්ති පත්‍ර ලියාපදිංචි කිරීමේ අංශයේ ලියාපදිංචි කිරීමට කටයුතු කළ යුතුය.

මුද්‍රණකරුවන්ගේ සහ ප්‍රකාශකයන්ගේ ආඥා පනතේ ( 179 අධිකාරය) යටතේ එම මුද්‍රණාලය මඟින් මුද්‍රණය කරනු ලබන සෑම ප්‍රකාශනයකම පිටපත් 05 බැගින් මෙම දෙපාර්තමේන්තුව වෙත ලබා දීම අත්‍යවශ්‍ය වේ. ඒ අනුව, ශ්‍රී ලංකාව තුළ මුද්‍රණය කරනු ලබන සියලුම ග්‍රන්ථ පුවත්පත් සහ වෙනත් මුද්‍රිත ප්‍රකාශනවල ජාතික එකතුවක් අනාගත පරම්පරාව උදෙසා ස්ථිර ලෙස සංරක්ෂණය කළ හැකිය.

ඉහත සඳහන් පරිදි නීතිමය අවශ්‍යතා ඉටු නොකිරීම නීති විරෝධී වේ.

වැඩි විස්තර සඳහා සහකාර පොත් සහ ප්‍රවෘත්ති පත්‍ර රෙජිස්ට්‍රාර්/චමිලා ප්‍රියංගනී මිය (0112688755/ 0112694523) සමඟ සම්බන්ධ විය හැකිය.

ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල්
ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව,
අංක 07, පිලිප් ගුණවර්ධන මාවත, කොළඹ 07.